# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021

## මෙම විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මාර්ගගත (Online) ක්‍රමය මගින් පමණි

අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය (https://doenets.lk) මගින්, හෝ මාර්ගගත විභාග වෙබ් අඩවිය (https://online exams.gov.lk/eic) මගින් හෝ දෙපාර්තමේන්තු ජංගම දුරකථන යෙදවුම ("DoE" mobile app) මගින් ප්‍රසිද්ධ කරනු ලබන අතර ඊට ඇතුළත් වී අයදුම්පත ඉදිරිපත් කළ හැක.

මෙම විභාගයට පෞද්ගලික අයදුම්කරුවකු ලෙස පෙනී සිටීම සඳහා වන අයදුම්පත් 2021 ජූලි 05 වන දින සිට ජූලි 30 වන දින මධ්‍යම රාත්‍රී 12.00 පැය දක්වා භාරගනු ලැබේ. සෑම පෞද්ගලික අයදුම්කරුවකු ම මෙම නිවේදනය සම්පූර්ණයෙන් ම හොඳින් කියවා අවබෝධ කරගෙන ඉහත වෙබ් අඩවියට පිවිස තම අයදුම්පත මාර්ගගත ක්‍රමයට (online) සම්පූර්ණ කොට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රයේ විභාගයට පෙනී සිටීමට තෝරාගත් නගරය හා විෂයයන් ඇතුළත් කිරීමේ දී නිවැරදිවම ඇතුළත් කිරීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. උපරිම වශයෙන් ප්‍රධාන විෂයන් 03 ක් සඳහා පමණක් පෙනී සිටීමට අයදුම්කරුවන්ට ඉඩ දෙනු ලැබේ. ඊට අමතරව අවශ්‍යතාව පරිදි විෂය අංක 12 – සාමාන්‍ය පොදු පරීක්ෂණයට හා විෂය අංක 13 – සාමාන්‍ය ඉංග්‍රීසි විෂයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කළ හැකිය.

**මෙවර විභාගයට අයදුම් කිරීම ප්‍රධාන අදියර දෙකකින් සිදු කළ යුතු ය.**

I අදියර - තොරතුරු ඇතුළත් කර යොමු අංකය (Reference Number) ලබා ගැනීම.

ඔබගේ පෞද්ගලික තොරතුරු, විභාගය පිළිබඳ තොරතුරු හා විෂයයන් පිළිබඳ තොරතුරු හා ගෙවීම් ක්‍රමය පිළිබඳ තොරතුරු ඇතුළත් කරන්න. ඔබ තැපැල් මාර්ගික ගෙවීම් සිදු කරන්නේ නම් යොමු අංකය (Reference Number) ලබා ගත යුතු ය.

II අදියර - විභාග ගාස්තු ගෙවීම හා අයදුම්පත බාගත (Download) කිරීම

ඔබට ලැබී ඇති යොමු අංකය (Reference Number) තැපැල් කාර්යාලයට ලබාදී විභාග ගාස්තු ගෙවීමෙන් පසුව ඔබට ලැබී ඇති කෙටි පණිවිඩයේ (SMS) ඇති සබැඳිය (link) සක්‍රිය කිරීමෙන් හෝ නැවත වෙබ් අඩවියට ඇතුළත් වීම මගින් ඔබට ලැබෙන පිටුවේ "Download AL 2021 Application" අයිකනය තේරීම (Click) මගින් ඔබගේ අයදුම්පත බාගත (Download) කර ගත හැක.

ඔබ බැංකු කාඩ්පතක් මගින් ගෙවීම් සිදු කරන විට ගෙවීම සාර්ථකව අවසන්වූ පසුව ඉහත අයිකනය මගින්ම අයදුම්පත බාගත (Download) කර ගත හැක.

**විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාලයක් මගින් හෝ ඕනෑම බැංකු කාඩ්පතක් මගින් සිදු කළ හැකිය**

**02. අයදුම්පත් :**

උපදෙස් පරිදි මාර්ගගත (online) ආකාරයට අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහි මුද්‍රිත පිටපතක් ලබා ගන්න. මුද්‍රිත පිටපත ඔබ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතු අතර අවශ්‍ය වුවහොත් එය ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතු ය.

**රජයේ පාසලක ඉගෙන ගනිමින් ම පෞද්ගලික අයදුම්කරුවකු ලෙස විභාගයට අයදුම් කිරීම හෝ පෙනී සිටීම සපුරා තහනම්වේ. එසේ කළහොත් විභාග ප්‍රතිඵල අවලංගු කොට ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.**

**2.1 පද්ධතියට ප්‍රවේශ වීම - I අදියර**

i) අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත Click කිරීම මගින් හෝ
- විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (mobile application) වන "DoE" වෙත පිවිස "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත Click කිරීම මගින් හෝ
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසෙන්න.

ii) G.C.E. AL 2021 - Student Registration (Private) අයිකනය තේරීම මගින් පෞද්ගලික අයදුම්කරුවන්ට විභාගයට ඉල්ලුම් කිරීමට හැකි වේ.

iii) ඔබගේ පෞද්ගලික තොරතුරු, විභාගයට පෙනී සිටින නගරය, මාධ්‍යය ඇතුල් කිරීමෙන් හා තෝරා ගැනීමෙන් අනතුරුව ඔබ පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඇතුළත් කිරීම සඳහා විෂය තෝරාගත යුතු ය.

iv) **(අ) (13) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය :**

ප්‍රධාන විෂයයන් තුන සහ සාමාන්‍ය පොදු පරීක්ෂණයට අමතරව අයදුම්කරුවන්ට සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ද ඉල්ලුම් කළ හැකි ය. සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා ලබාගන්නා ප්‍රතිඵලය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා උපයෝගී කරගනු නොලැබේ. එහෙත් මෙම විෂය සඳහා ලබාගන්නා ශ්‍රේණිය අ.පො.ස. (උ.පෙළ). සහතිකයේ ඇතුළත් කරනු ලැබේ.

**(ආ) (12) සාමාන්‍ය පොදු පරීක්ෂණය :**

යම් අයදුම්කරුවකු ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන්නේ නම් ඔහු/ ඇය මෙම විෂයට. පෙනී සිට අනිවාර්යයෙන්ම අවමය ලකුණු 30ක් ලබාගත යුතු ය. මීට පෙර අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිට එක් අවස්ථාවකදී ලකුණු 30කට වඩා ලබා ඇත්නම් නැවත පෙනී සිටීම අවශ්‍ය නොවේ.

**(ඇ) ප්‍රායෝගික පරීක්ෂණ සහිත විෂයයන් :**

විෂය අංක 28, 52, 53, 54, 55, 56, 57, 58, 59, 65 හා 66 යන විෂයයන් සඳහා ලිඛිත පරීක්ෂණයන්ට ඉදිරිපත් වන සියලු ම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත සහ ප්‍රායෝගික යන කොටස් දෙකට ම ඉදිරිපත් වන අපේක්ෂකයින්ට පමණක් උක්ත විෂයයන්වල ප්‍රතිඵල නිකුත් කරනු ඇත. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් වෙත ලබා දෙන ප්‍රවේශ පත්‍රයේ සඳහන් දිනයේදී ම ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය. එම දිනයේදී ඉදිරිපත් වීමට නොහැකි වූ අයදුම්කරුවන්ට වෙනත් අවස්ථාවකදී ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ඈ) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2016/13 හා 2016.04.26 දිනැති චක්‍රලේඛයට අනුකූලව විෂයයන් තෝරා ගත යුතුයි. එම චක්‍රල්ඛයේ සම්මත විෂය ධාරාවලට අනුගත නොවන වෙනත් විෂය සංකලනයන් තෝරාගත් අවස්ථාවලදී අයදුම්කරුවන් "**නිශ්චිත විෂය ධාරාවකට අයත් නොවන (Non Stream)**" යනුවෙන් හඳුන්වා දෙන අතර, එම අයදුම්කරුවන් සඳහා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී දිවයින් තරාව (Island Rank) හා දිස්ත්‍රික් තරාව (District Rank) නිකුත් කරනු නොලැබේ. එම චක්‍රලේඛයට පටහැනිව විෂය සංකලන තෝරා ගැනීමෙන් අයදුම්කරුවන්ට මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා පිළිබඳ ව මෙම දෙපාර්තමේන්තුවට වගකීමක් නොමැති බව කරුණාවෙන් සලකන්න.

2.2 2021.07.30 වැනි දින මධ්‍යම රාත්‍රී 12.00 පැයෙන් පසුව මෙම විභාගය සඳහා අයදුම් කළ නොහැක. නියමිත දින රාත්‍රී 12.00 පැයෙන් පසු මාර්ගගත ප්‍රවේශය වසා තබනු ලැබේ.

2.3 එක් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. තොරතුරු වෙනස් කර අයදුම්පත්‍ර එකකට වඩා ඉදිරිපත් කරන අවස්ථාවල දී සියලු ම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම අයදුම්කරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කරනු ලැබේ. විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු වුවද මෙවැනි වංචනික ක්‍රියාවක් ඔප්පු වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර අදාළ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුව දඬුවම් කරනු ලැබේ.

03. විභාග ගාස්තු ගෙවීම හා අයදුම්පත බාගත (Download) කිරීම – II අදියර

විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (Credit/Debit payment) මගින් සිදු කළ හැකිය.

3.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම් "Payment Method" යටතේ ඇති "Pay by Postal Department" සබැඳිය තෝරාගත යුතුය. එහිදී ඔබට ලැබෙන යොමු අංකය (Reference Number) තැපැල් කාර්යාලයට ලබාදී ඔබගේ විභාග ගාස්තු ගෙවා ලබාගන්නා කුවිතාන්සිය ඔබ භාරයේ සුරක්ෂිතව තබාගත යුතුය. මුදල් ගෙවීමෙන් පසු විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියට පිවිස ඔබගේ අයදුම්පත්‍රය බාගත (Download) කරගත හැකි වේ.

**ගෙවීම සාර්ථක වූ පසු ඔබට ලැබෙන කෙටි පණිවිඩයේ ඇති සබැඳිය (link) සක්‍රිය කිරීම මගින් අදළ වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත (Download) කර ගැනීමට හැකි වේ.**

3.2 බැංකු කාඩ්පත් (Credit/debit cards) මගින් ගෙවීම් සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/ debit card" අයිතමය තෝරා ගත යුතුය.

| විෂය ගණන | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 150/- | 200/- | 250/- | 350/- | 400/- |

04. ඔබ ඉදිරිපත් කරන අයදුම්පතට අනුව විභාග ප්‍රවේශ පත්‍රය ඉදිරියේදී ඔබ වෙත ලැබෙනු ඇත. විභාග ප්‍රවේශ පත්‍රයේ කිසියම් සංශෝධනයක් අපේක්ෂා කරන්නේ නම් විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු පසු විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස දින හතක් (07) ඇතුළත අදාළ සංශෝධන සිදු කිරීමට අවස්ථාව සළසා දෙනු ලැබේ.

05. ඔබ ඉදිරිපත් කරන අයදුම්පතෙහි සඳහන් තොරතුරු හා විභාගයට පෙනී සිටීමට ඔබට ලැබෙන ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් තොරතුරු අතර පරස්පර විරෝධතාවක් තිබේ නම් ඔබගේ විභාග ප්‍රවේශ පත්‍රය ලැබුණු වහා ම පහත දුරකථන අංක මගින් විභාග දෙපාර්තමේන්තුවේ පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව ඇමතිය යුතුය.

06. සෑම පෞද්ගලික අයදුම්කරුවෙක්ම තමාගේ ස්ථිර පදිංචි ලිපිනය හා දුරකථන අංකය ඇතුළත් කළයුතු අතර, අධ්‍යාපනය ලබන පෞද්ගලික හෝ ජාත්‍යන්තර පාසලේ නම සහ ලිපිනය හෝ දුරකථන අංකය ඇතුළත් නොකළ යුතු ය.

07. අනන්‍යතාව ඔප්පු කිරීම

විභාගයට පෙනී සිටීමේදී අයදුම්කරුවන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ජාතික හැඳුනුම්පතක් මෙතෙක් ලබා නොමැති අයදුම්කරුවකු වේ නම් ඒ සඳහා ග්‍රාම නිලධාරීන් මගින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් වෙත අයදුම්පතක් නොපමාව ඉදිරිපත්කර තම ජාතික හැඳුනුම්පත සකස් කරගත යුතුය.

08. මෙම විභාගය සඳහා රජයේ පාසල්වලින්, ගාස්තු අයකරන / නොකරන රජය අනුමත පෞද්ගලික පාසල්වලින් සහ අනුමත පිරිවෙන්වලින් පළමු වරට සහ දෙවන වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් හැර අනෙකුත් සියලු ම අයදුම්කරුවන් නියමිත විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එසේ ගාස්තු ගෙවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. මෙම විභාගය සඳහා අයදුම්කරනු ලබන විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත අයදුම්කරුවන් වේ නම් "candidates with special education needs" යටතේ තිබෙන තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

**සටහන :** මෙම විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තු සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

මෙම විභාගයට අයදුම් කිරීමෙන් අනතුරුව එක ප්‍රශ්න පත්‍රයක කොටසකට හෝ පෙනී නොසිටි අපේක්ෂකයින් පමණක් විභාගයට පෙනී නොසිටි අපේක්ෂකයින් සේ සළකනු ලැබේ. එවැනි අපේක්ෂකයන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපාන විභාග වාරය අවලංගු නොවන බැවින්, ඒ සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම කිසිසේත් ම අවශ්‍ය නොවේ. කිසිදු විෂයකට පෙනී නොසිටි බව ඔප්පු කිරීමට ඇති එක ම සාක්ෂිය වන්නේ තමන් වෙත නිකුත් කර ඇති ප්‍රවේශ පත්‍රය ආරක්ෂා සහිතව තබා ගැනීම පමණි. ඒ සම්බන්ධයෙන් වෛද්‍ය සහතික හෝ වෙනත් ඉල්ලීම් මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

උක්ත කරුණු සම්බන්ධයෙන් යම් විමසීමක් කළ යුතු නම් පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.

**දුරකථන අංක 011-2784208 / 011-2784537 / 011-2786616 ෆැක්ස් අංක : 011-2784422**

**බී. සනත් පූජිත**
**විභාග කොමසාරිස් ජනරාල්.**

**යොමු අංකය : 6/3/ AL/2021**
**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තුමේන්තුව තැ.පෙ. 1503, කොළඹ.**
**2021.07.05**

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021

## අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා විභාග අයදුම්කරුවන්ට තාක්ෂණ උපදෙස්

**01. පද්ධතියට ප්‍රවේශ වීම**

1.1 අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති " මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත Click කිරීම මගින් හෝ
- විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (mobile application) වන "DoE" වෙත පිවිස "මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග)" මත Click කිරීම මගින් හෝ
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසෙන්න.

1.2 G.C.E. AL 2021 - Student Registration (Private) අයිතමය තේරීම මගින් පෞද්ගලික අයදුම්කරුවන්ට විභාගයට ඉල්ලුම් කිරීමට හැකි වේ.

1.3 පළමුව ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, දුරකථන අංකය ඇතුළත් කර ලියාපදිංචි විය යුතු ය.

1.4 ඔබට ජාතික හැඳුනුම්පතක් නොමැති නම් 0112784537/0112784208/0112786616 යන දුරකථන අංකවලට අමතා තාවකාලික අංකයක් ලබා ගන්න.

1.5 ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් පසුව ඔබට ලැබෙන කෙටි පණිවිඩයෙහි (SMS) සඳහන් කේත අංකය (OTP) භාවිත කර පද්ධතියට ප්‍රවිෂ්ට විය යුතු ය.

1.6 එහි සඳහන් උපදෙස් හොඳින් කියවා වැඩිදුර උපදෙස් සදහා "Instructions" ලෙස පෙන්වන බොත්තම (Button) තෝරන්න (Click). තාක්ෂණික උපදෙස්, පොදු උපදෙස් හා උපදෙස් වීඩියෝව නැරඹීමෙන් අනතුරුව "Next" බොත්තම (Button) තෝරා අයදුම්පත සම්පූර්ණ කිරීම ආරම්භ කරන්න.

1.7 ඔබගේ පෞද්ගලික තොරතුරු (අනු අංක 02හි සඳහන් පරිදි) විභාගයට පෙනී සිටින දිස්ත්‍රික්කය, නගරය හා මාධ්‍යය ඇතුල් කිරීමෙන් හා තේරීමෙන් (අනු අංක 03හි සඳහන් පරිදි) පසුව ඔබ පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයයන් (අනු අංක 04හි සඳහන් පරිදි) ඇතුළත් කළ හැකි වේ.

**02. Personal Information**

**2.1 Full Name in English**

උප්පැන්න සහතිකය අනුව සම්පූර්ණ නම ඇතුළත් කරන්න. මුලකුරු සමග නම ඇතුළත් නොකරන්න.
උදාහරණ : KULASOORIYAGE MAHESH SUJITH DE SILVA

පද්ධතියට ඇතුළත් කිරීමට නොහැකි අකුරු 90 කට වඩා වැඩි දිග නමක් ඇත්නම් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ඉහත දක්වා ඇති දුරකථන අංක අමතා උපදෙස් ලබා ගන්න.

2.2 NIC : ඔබ පද්ධතියට ලියාපදිංචි වූ විට ජාතික හැඳුනුම්පත් අංකය ප්‍රදර්ශනය වනු ඇත. හොඳින් පරීක්ෂා කර බලා එය නිවැරදි බවට තහවුරු කර ගන්න.

2.3 Date of Birth

උප්පැන්න සහතිකය අනුව උපන් දිනය ඇතුළත් කිරීම හෝ තේරීම සිදු කරන්න.

2.4 Gender

ස්ත්‍රී/පුරුෂභාවය දැක්වීම සඳහා පුරුෂ නම් "Male" යන්න ද ස්ත්‍රී නම් "Female" යන්නද තෝරන්න.

2.5 විද්‍යුත් තැපැල් ලිපිනය (Email Address) :
පෞද්ගලික දුරකථන අංකය [ජංගම /Mobile Number] :
පෞද්ගලික දුරකථන අංකය [ස්ථාවර/Telephone Home] :
} මෙම තොරතුරු ඇතුළත් කරන්න.

2.6 Private Address

ලිපිනය : ස්ථිර ලිපිනය සඳහන් කළ යුතු ය.

කිසි විටෙකත් තාවකාලික පදිංචි ස්ථානයේ ලිපිනය හෝ පෞද්ගලික/ජාත්‍යන්තර පාසලේ ලිපිනය ඇතුළත් නොකළ යුතුය.

2.7 පෞද්ගලික ලිපිනය ඇතුළත් කිරීමේදී තැපැල් නගරය වෙන් කර දක්වන්න. තැපැල් නගරය දෙවරක් නොයොදන්න.

**උදාහරණ : ලිපිනය : අංක 25, පන්සල පාර, හෝමාගම නම් එය ඇතුළත් කළ යුතු වන්නේ**
**Private Address : No. 25, Temple Road,**
**Postal Town : Homagama**

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

**03. Exam Request**

3.1 District and Town you expect to sit for the examination

තෝරාගත් දිස්ත්‍රික්කය සහ නගරය : ඔබ විභාගයට පෙනී සිටින දිස්ත්‍රික්කය තේරීමෙන් පසු ඊට අදළ නගර ලැයිස්තුව ලැබෙනු ඇත. එමගින් විභාගයට පෙනී සිටින නගරය තෝරාගන්න. **වැරදි නගරයක් ඔබ විසින් තේරීමෙන් ඉතා දුර විභාග මධ්‍යස්ථානයක් ලැබීමට ඉඩ ඇත.** අදළ නගර හා නගර අංක සහිත ලේඛනයක් මේ සමග අමුණා ඇත. ඔබ ඉල්ලා ඇති විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමක් සිදු කරනු නොලැබේ.

3.2 Attempt Number

ඔබ විභාගයට අයදුම්කරන්නේ කී වෙනි වතාවට දැයි තෝරන්න.

3.3 Special education needs applicant (Vision/Hearing/Other ?)

3.3. 1 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා රහිත නම් No යන්න තෝරන්න.

3.3. 2 ඔබ යම්කිසි විශේෂ අධ්‍යාපන අවශ්‍යතාවන් සහිත අයදුම්කරුවකු නම් Yes යන්න තෝරන්න. ඉන්පසු ලැබෙන පහත තොරතුරු සම්පූර්ණ කරන්න.

- Type of the disability – ආබාධයේ ස්වභාවය
  Braille - බ්‍රේල් අයදුම්කරුවෙකි.
  Hearing – ශ්‍රවණාබාධිත අයදුම්කරුවෙකි.
  Vision - දෘෂ්‍යාබාධිත අයදුම්කරුවෙකි.
  Body functions/structure – කායික ආබාධ සහිත අයදුම්කරුවෙකි.
  Other- වෙනත් ආබාධ සහිත අයදුම්කරුවෙකි.
- If special center required select it – විශේෂ මධ්‍යස්ථානයක් අයදුකරන්නේ නම් එය තෝරන්න.
- More details about the disability – ආබාධිත තත්ත්වය පිළිබඳ වෙනත් තොරතුරු

**ඊළඟ පියවරට යාමට Next අයිකනය භාවිත කරන්න.**

04. Subject Information

2021 වසරේදී විභාගයට පෙනී සිටීමට නියමිත විෂයන් හා පෙනී සිටින මාධ්‍යය

4.1 Preferred language medium

පෙනී සිටින භාෂා මාධ්‍යය : පෙනී සිටීමට අපේක්ෂිත භාෂා මාධ්‍යය තෝරන්න. ඔබ මාධ්‍ය දෙකකින් පෙනී සිටින අයදුම්කරුවකු නම් ඉංග්‍රීසි මාධ්‍යට අමතරව තමා පෙනී සිටින අනෙක් මාධ්‍ය ප්‍රධාන මාධ්‍ය ලෙස මෙහිදී තේරිය යුතුය.

4.2 අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද 2016/ 13 හා 2016.04.26 දිනැති චක්‍රලේඛයට අනුකූලව උපරිම වශයෙන් හර විෂයයන් 3ක්, 13 – සාමාන්‍ය ඉංග්‍රීසි සහ 12 – සාමාන්‍ය පොදු පරීක්ෂණය යන විෂයයන් තෝරා ගත හැක.

4.3 එක් එක් විෂයයට අදළ මාධ්‍ය නිවැරදිව ඔබ විසින් තේරිය යුතු ය. අවශ්‍ය නම් ඔබට විභාගය සඳහා භාෂා මාධ්‍ය දෙකකින් පෙනී සිටිය හැක.

- සිංහල හා ඉංග්‍රීසි
- දෙමළ හා ඉංග්‍රීසි

කිසිවිටෙකත් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් එකවර විභාගයට පෙනී සිටිය නොහැක.

4.4 ඉතා වැදගත් :

i. භෞතීය විද්‍යා විෂය ධාරාව යටතේ 07 ගණිතය විෂයට ඉල්ලුම් කළ නොහැකි ය.

ii. විෂය අංක 14, 15, 16, 17, 18 හා 19 යන විෂයයන් අතුරෙන් එක් විෂයකට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

iii. (65) ඉංජිනේරු තාක්ෂණවේදය හා (66) ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයයන් දෙකෙන් ඉල්ලුම් කළ හැක්කේ එක් විෂයකට පමණි.

iv. (67) තාක්ෂණවේදය සඳහා විද්‍යාව විෂයට ඉල්ලුම් කළ හැක්කේ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය හෝ ඉල්ලුම් කරන්නේ නම් පමණි.

v. ආගම් හා ශිෂ්ටාචාර විෂයන් අතුරෙන් යම් ආගමක් තෝරා ගන්නේ නම් ඊට අදාළ ශිෂ්ටාචාර විෂය තෝරා ගත නොහැකි ය. එසේම ශිෂ්ටාචාර විෂයන් තෝරා ගන්නේ නම් ඊට අදාළ ආගම විෂය තෝරා ගත නොහැකි ය.

vi. 52 නර්තනය විෂය ඉල්ලුම් කිරීමේදී ඔබ ඉගෙනුම ලැබූ නර්තන වර්ගය තෝරන්න. මෙම වෙන් කර ගැනීම ප්‍රායෝගික පරීක්ෂණවලට පමණක් අදාළ වේ.

vii. 54 – පෙරදිග සංගීත විෂය ඉල්ලුම් කළ හැක්කේ සිංහල මාධ්‍යයෙන් පමණි.

viii. 55 – කර්ණාටක සංගීතය ඉල්ලුම් කළ හැක්කේ දෙමළ මාධ්‍යයෙන් පමණි.

ix. 56 – බටහිර සංගීතය විෂය ඉල්ලුම් කළ හැක්කේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.

x. අයදුම් පත්‍රයේ සඳහන් කරන ලද විෂයන් පසුව වෙනස් කිරීමට හෝ විභාග ශාලාවේ දී විෂයන් මාරු කිරීමට හෝ අමතර විෂයන්ට පෙනී සිටීමට හෝ ඉඩ දෙනු නොලැබේ. යම් හෙයකින් එසේ පෙනී සිටියහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අවලංගු කිරීමට සිදුවනු ඇත.

4.5 Common General Test

සාමාන්‍ය පොදු පරීක්ෂණය : අයදුකරන්නේ නම් "Common General Test" ඉදිරියෙන් Yes යන්න තෝරා එයට අදාළ භාෂා මාධ්‍යය ද තෝරන්න.

4.6 General English

සාමාන්‍ය ඉංග්‍රීසි ද අයදුම් කරන්නේ නම් "General English" ඉදිරියෙන් Yes යන්න තෝරන්න.

**ඊළඟ පියවරට යාමට Submit අයිකනය භාවිත කරන්න.**

4.7 විෂයන් තෝරා ගත් පසු එම විෂයන් අයත් වන විෂය ධාරාව (Stream) ඔබට දර්ශනය වනු ඇත. ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමු කරන්න.

"submit" බොත්තම Click කළ පසු Exam Application Summary පරීක්ෂාකර බලන්න. වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නම් "Reset the Exam Application"තෝරා අවශ්‍ය වෙනස්කම් සිදු කර ගන්න. "Payment Methods"තෝරාගත් පසු කිසිදු වෙනසක් සිදු කළ නොහැක.

05. Payment Methods

විභාග ගාස්තු ගෙවීම තැපැල් කාර්යාල මගින් හෝ බැංකු කාඩ්පත් මගින් (Credit/Debit Card) මගින් සිදු කළ හැකිය.

5.1. තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කරන්නේ නම් "Payment Method"යටතේ ඇති "Pay by Postal Department" අයිතමය තෝරා ගත යුතු ය. එහිදී ඔබට ලැබෙන යොමු අංකය (Reference Number) තැපැල් කාර්යාලයට ලබාදී ඔබගේ විභාග ගාස්තු ගෙවන්න. කුවිතාන්සිය ඔබ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතු ය.

මුදල් ගෙවීමෙන් පසු විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියට පිවිස ඔබගේ අයදුම්පත්‍රය බාගත (Download) කර ගත හැකි වේ.

ගෙවීම සාර්ථකවූ පසු ඔබට ලැබෙන කෙටි පණිවිඩයේ ඇති සබැඳිය (link) සක්‍රීය කිරීම මගින් ද අදාළ වෙබ් අඩවියට පිවිස අයදුම්පත බාගත (Download) කර ගත හැකි වේ.

5.2 බැකු කාඩ්පත් (Credit/Debit card) මගින් ගෙවීම සඳහා "Payment method" යටතේ ඇති "pay by credit/ debit card"අයිතමය තෝරා ගත යුතුය. අදාළ ගෙවීම් සිදු කිරීමෙන් පසු ඔබගේ අයදුම්පත බාගත (Download) කර ගත හැක.

| විෂය ගණන | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| ගාස්තුව රුපියල් | 150/- | 200/- | 250/- | 350/- | 400/- |

**ගෘහ ආර්ථික විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණවේදය හා ජෛව පද්ධති තාක්ෂණවේදය යන විෂයන්ට පෙනී සිටින අයදුම්කරුවන් රු. 300/- බැගින් ප්‍රායෝගික පක්ෂණය සඳහා මීට අමතරව ගෙවිය යුතු ය. එම මුදල ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබූ විට පමණක් ගෙවිය යුතු අතර මේ සමඟ ගෙවීම් කිරීම අවශ්‍ය නොවේ.**

06. "Download AL Exam 2021 - Application" අයිතමය මගින් ඔබගේ අයදුම් පත්‍රය බාගත කර ගත හැක. එහි මුද්‍රිත පිටපතක් ඔබ සන්තකයේ තබා ගන්න.

07. **අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම :**

1. පෞද්ගලික අයදුම්කරුවන් ලෙස අයදුම්පතක් ඉදිරිපත් කළ හැක්කේ රජයේ පාසලකින් අස්වීම් සහතිකය ලබාගත් හෝ පෞද්ගලික පාසලකින් ඉදිරිපත් වන අයදුම්කරුවන්ට පමණි. රජයේ පාසලක ඉගෙන ගනිමින් ම පෞද්ගලික අයදුම්කරුවන් ලෙස ඉදිරිපත් වීම තහනම්ය. යම් පාසල් ශිෂ්‍යයකු පෞද්ගලිකව ඉදිරිපත් වීම වරදක් වන අතර එවැනි අයදුම්කරුවන් සඳහා ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.
2. පෞද්ගලික/ජාත්‍යන්තර පාසල්වල ලිපිනයන් පෞද්ගලික ලිපිනය ලෙස සඳහන් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## අ.පො.ස (උ. පෙළ) විභාගය - 2021
## විෂය ලේඛනය

| | විෂයය | විෂය අංකය |
|---|---|---|
| | භෞතික විද්‍යාව | 01 |
| | රසායන විද්‍යාව | 02 |
| | ගණිතය | 07 |
| | කෘෂි විද්‍යාව | 08 |
| | ජීව විද්‍යාව | 09 |
| | සංයුක්ත ගණිතය | 10 |
| | උසස් ගණිතය | 11 |
| * | සාමාන්‍ය පොදු පරීක්ෂණය | 12 |
| * | සාමාන්‍ය ඉංග්‍රීසි | 13 |
| | සිවිල් තාක්ෂණවේදය | 14 |
| | යාන්ත්‍රික තාක්ෂණවේදය | 15 |
| | විදුලිය, ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය | 16 |
| | ආහාර තාක්ෂණවේදය | 17 |
| | කෘෂි තාක්ෂණවේදය | 18 |
| | ජෛව සම්පත් තාක්ෂණවේදය | 19 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 20 |
| | ආර්ථික විද්‍යාව | 21 |
| | භූගෝල විද්‍යාව | 22 |
| | දේශපාලන විද්‍යාව | 23 |
| | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | 24 |
| | ඉන්දීය ඉතිහාසය | 25A |
| | යුරෝපා ඉතිහාසය | 25B |
| | නූතන ලෝක ඉතිහාසය | 25C |
| | ගෘහ ආර්ථික විද්‍යාව | 28 |
| | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | 29 |
| | ව්‍යාපාර සංඛ්‍යානය | 31 |
| | ව්‍යාපාර අධ්‍යයනය | 32 |
| | ගිණුම්කරණය | 33 |
| | බුද්ධ ධර්මය | 41 |
| | හින්දු ධර්මය | 42 |
| | ක්‍රිස්තියානි ධර්මය | 43 |
| | ඉස්ලාම් | 44 |

| | විෂයය | විෂය අංකය |
|---|---|---|
| | බෞද්ධ ශිෂ්ටාචාරය | 45 |
| | හින්දු ශිෂ්ටාචාරය | 46 |
| | ඉස්ලාම් ශිෂ්ටාචාරය | 47 |
| | ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරය | 48 |
| | ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය | 49 |
| | චිත්‍ර කලාව | 51 |
| | නර්තනය (දේශීය – උඩරට) | 52A |
| | නර්තනය (දේශීය – පහතරට) | 52B |
| | නර්තනය (දේශීය – සබරගමු) | 52C |
| | නර්තනය (භාරත) | 53 |
| | පෙරදිග සංගීතය | 54 |
| | කර්ණාටක සංගීතය | 55 |
| | බටහිර සංගීතය | 56 |
| | නාට්‍ය හා රංග කලාව (සිංහල) | 57 |
| | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | 58 |
| | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | 59 |
| | ඉංජිනේරු තාක්ෂණවේදය | 65 |
| | ජෛව පද්ධති තාක්ෂණවේදය | 66 |
| | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | 67 |
| | සිංහල | 71 |
| | දෙමළ | 72 |
| | ඉංග්‍රීසි | 73 |
| | පාලි | 74 |
| | සංස්කෘත | 75 |
| | අරාබි | 78 |
| | මැලේ | 79 |
| | ප්‍රංශ | 81 |
| | ජර්මන් | 82 |
| | රුසියන් | 83 |
| | හින්දි | 84 |
| | චීන | 86 |
| | ජපන් | 87 |

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021
## විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර

**කොළඹ දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| කොටහේන | 01 |
| මරදාන | 02 |
| බොරැල්ල | 03 |
| මාලිගාවත්ත | 04 |
| කොලොන්නාව | 05 |
| කුරුඳුවත්ත | 06 |
| බම්බලපිටිය | 07 |
| හැව්ලොක් ටවුම | 08 |
| නුගේගොඩ | 09 |
| කෝට්ටේ | 10 |
| බත්තරමුල්ල | 11 |
| මොරටුව | 12 |
| පිළියන්දල | 13 |
| හෝමාගම | 14 |
| මහරගම | 15 |
| හංවැල්ල | 16 |
| අවිස්සාවේල්ල | 17 |

**ගම්පහ දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| මීගමුව | 26 |
| සීදූව | 27 |
| කොච්චිකඩේ | 28 |
| මිනුවන්ගොඩ | 29 |
| දිවුලපිටිය | 30 |
| වේයන්ගොඩ | 31 |
| මීරිගම | 32 |
| ගම්පහ | 33 |
| ගණේමුල්ල | 34 |
| නිට්ටඹුව | 35 |
| ජාඇල | 36 |
| වත්තල | 37 |
| රාගම | 38 |
| කැලණිය | 39 |
| මහර | 40 |
| දෙම්පේ | 41 |
| කිරිදිවැල | 42 |

**කළුතර දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| හොරණ | 51 |
| බුලත්සිංහල | 52 |
| පානදුර | 53 |
| බණ්ඩාරගම | 54 |
| කළුතර | 55 |
| බේරුවල | 56 |
| මතුගම | 57 |
| අගලවත්ත | 58 |
| කඹුරාවල | 59 |
| අළුත්ගම | 60 |

**මාතලේ දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| මාතලේ | 71 |
| ගලේවෙල | 72 |
| නාඋල | 73 |
| ලග්ගල පල්ලේගම | 74 |
| දඹුල්ල | 75 |

**මහනුවර දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| මහනුවර | 81 |
| කඩුගන්නාව | 82 |
| දෙල්තොට | 83 |
| තලාතුඔය | 84 |
| පිළිමතලාව | 85 |
| කටුගස්තොට | 86 |
| තෙල්දෙනිය | 87 |
| වත්තේගම | 88 |
| උඩුදුම්බර | 89 |
| පූජාපිටිය | 90 |
| හසලක | 91 |
| නුගවෙල | 92 |
| ගලගෙදර | 93 |
| ගම්පොල | 94 |
| නාවලපිටිය | 95 |
| අලවතුගොඩ | 96 |
| අකුරණ | 97 |
| පේරාදෙණිය | 98 |

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| හැඳුනුවැව | 101 |
| නුවරඑළිය | 102 |
| වතුමුල්ල | 103 |
| හැටන් | 104 |
| ගනිගත්හේන | 105 |
| හඟුරන්කෙත | 106 |
| මස්කෙළිය | 107 |
| තලවකැලේ | 108 |
| කොත්මලේ | 109 |
| වලපනේ | 110 |

**ගාල්ල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| අම්බලන්ගොඩ | 111 |
| බලපිටිය | 112 |
| කරන්දෙනිය | 113 |
| ගාල්ල | 114 |
| හබරාදූව | 115 |
| තවලම | 116 |
| බද්දේගම | 117 |
| ඇල්පිටිය | 118 |
| නාගොඩ | 119 |
| බෙන්තොට | 120 |
| ගිංතොට | 121 |
| අහංගම | 122 |
| උනවටුන | 123 |
| උඩුගම | 124 |

**මාතර දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| වැලිගම | 125 |
| මාතර | 126 |
| කඹුරුපිටිය | 127 |
| හක්මණ | 128 |
| දෙයියන්දර | 129 |
| දෙව්නුවර | 130 |
| දික්වැල්ල | 131 |
| අකුරැස්ස | 132 |
| කොටපොල | 133 |
| දෙනියාය | 134 |

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| බෙලිඅත්ත | 141 |
| ගැටමාන්න | 142 |
| වලස්මුල්ල | 143 |
| කටුවන | 144 |
| වීරකැටිය | 145 |
| තංගල්ල | 146 |
| නාකුළුගමුව | 147 |
| අම්බලන්තොට | 148 |
| අඟුණකොළපැලැස්ස | 149 |
| හුංගම | 150 |
| හම්බන්තොට | 151 |
| තිස්සමහරාමය | 152 |
| ලුණුගම්වෙහෙර | 153 |
| සූරියවැව | 154 |

**යාපනය දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| චාවකච්චේරිය | 161 |
| යාපනය | 162 |
| ඩෙල්ෆ්ට් | 163 |
| කෝපායි | 164 |
| කරවෙඩ්ඩි | 165 |
| තෙල්ලිප්පලෙයි | 166 |
| පේදුරුතුඩුව | 167 |

**කිලිනොච්චිය දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| කිලිනොච්චිය | 171 |
| පලෙයි | 172 |

**මන්නාරම් දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| මන්නාරම | 176 |
| මුරුන්කන් | 177 |
| මඩු | 178 |

**මුලතිව් දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| මුලතිව් | 186 |
| මුල්ලියාවලෙයි | 187 |
| පුතුකුඩිඉරුප්පු | 188 |
| මල්ලාවි | 189 |
| යෝගපුරම් | 190 |

**වව්නියාව දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| වව්නියාව | 196 |
| ඕමන්තෙයි | 197 |

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| කන්තලේ | 206 |
| ත්‍රිකුණාමලය | 207 |
| මුත්තූර් | 208 |
| කින්නියා | 209 |
| පුල්මුඩේ | 210 |

**මඩකලපුව දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| මඩකලපුව | 216 |
| එරාවූර් | 217 |
| කාත්තන්කුඩි | 218 |
| වාලච්චනෙයි | 219 |
| කලුවංචිකුඩි | 220 |
| වෙන්කලඩි | 221 |
| ඔට්ටමාවඩි | 222 |

**අම්පාර දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| අම්පාර | 231 |
| දමන | 232 |
| උහන | 233 |
| දෙහිඅත්තකණ්ඩිය | 234 |
| සේරන්කඩ | 235 |
| පොතුවිල් | 236 |
| කල්මුනේ | 237 |
| අක්කරෙයිපත්තු | 238 |
| සම්මන්තුරේ | 239 |
| තින්දවූර් | 240 |
| තිරුක්කෝවිල් | 241 |

**පුත්තලම් දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| වෙන්නප්පුව | 251 |
| දංකොටුව | 252 |
| මාදම්පේ | 253 |
| හලාවත | 254 |
| මාරවිල | 255 |
| නාත්තන්ඩිය | 256 |
| පුත්තලම | 257 |
| මුන්දලම | 258 |
| ආණමඩුව | 259 |
| කල්පිටිය | 260 |

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| කුලියාපිටිය | 266 |
| බිංගිරිය | 267 |
| හෙට්ටිපොල | 268 |
| පන්නල | 269 |
| නාරම්මල | 270 |
| ගිරිඋල්ල | 271 |
| පොල්ගහවෙල | 272 |
| කුරුණෑගල | 273 |
| ඉබ්බාගමුව | 274 |
| දෙඩන්ගස්ලන්ද | 275 |
| මොරතිහ | 276 |
| මාවතගම | 277 |
| වාරියපොල | 278 |
| නිකවැරටිය | 279 |
| කොබෙයිගනේ | 280 |
| මහව | 281 |
| ගල්ගමුව | 282 |
| අලව්ව | 283 |

**අනුරාධපුරය දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| මැදවච්චිය | 291 |
| පදවි පරාක්‍රමපුර | 292 |
| කැකිරාව | 293 |
| ගල්නෑව | 294 |
| අනුරාධපුරය | 295 |
| ගලෙන්බිඳුනුවැව | 296 |
| කහටගස්දිගිලිය | 297 |
| නොච්චියාගම | 298 |
| තඹුත්තේගම | 299 |
| කැබිතිගොල්ලෑව | 300 |
| රඹෑව | 301 |
| මිහින්තලය | 302 |
| හොරොව්පතාන | 303 |
| පදවිය | 304 |

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| පොළොන්නරුව | 306 |
| හිඟුරක්ගොඩ | 307 |
| මනම්පිටිය | 308 |
| බකමූණ | 309 |
| මැදිරිගිරිය | 310 |
| ගිරිතලේ | 311 |

**බදුල්ල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| බණ්ඩාරවෙල | 316 |
| හල්දුම්මුල්ල | 317 |
| වැලිමඩ | 318 |
| බදුල්ල | 319 |
| පස්සර | 320 |
| මහියංගනය | 321 |
| ගිරාඳුරුකෝට්ටේ | 322 |
| හාලිඇල | 323 |
| අඹගස්දෝව | 324 |

**මොනරාගල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| බිබිල | 331 |
| මොනරාගල | 332 |
| වැල්ලවාය | 333 |
| බඩල්කුඹුර | 334 |
| බුත්තල | 335 |

**කෑගල්ල දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| කෑගල්ල | 341 |
| දැරණියගල | 342 |
| දෙහිඕවිට | 343 |
| රඹුක්කන | 344 |
| මාවනැල්ල | 345 |
| වරකාපොල | 346 |
| හෙම්මාතගම | 347 |
| අරණායක | 348 |
| රුවන්වැල්ල | 349 |
| යටියන්තොට | 350 |

**රත්නපුර දිස්ත්‍රික්කය**

| නගරය | නගර අංකය |
|---|---|
| ඇහැලියගොඩ | 356 |
| රත්නපුර | 357 |
| පැල්මඩුල්ල | 358 |
| ගොඩකවෙල | 359 |
| බලංගොඩ | 360 |
| කලවාන | 361 |
| නිවිතිගල | 362 |
| ඇඹිලිපිටිය | 363 |